# දකුණු පළාත් සභාව
# දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය.
# ලංසු සඳහා ආරාධනාවයි

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙනුවෙන් ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා එයට අනුබද්ධ ආයතන සඳහා 2023.06.01 දින සිට 2024.05.31 දින දක්වා වර්ෂයක කාල සීමාවක් සඳහා පහත සඳහන් කර ඇති ස්ථාන සඳහා පිරිසිදු කිරීමේ සේවාවන් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය වත්කමක් සහ අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති ආයතනවලින්/ලංසුකරුවන් වෙතින් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

02. **මේ සඳහා අභිලාශයක් දක්වන ලංසු තබන්නන්ට අදාල ලංසු ලියකියවිලි 2023.04.12 දින සිට 2023.05.02 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුළ පහත පරිදි ගාස්තු ගෙවීමෙන් ගාල්ල එස්.එච්.දහනායක මාවතේ පිහිටි දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.**

| විස්තරය | සේවාවේ කාල සීමාව | ලංසු සුරක්ෂණය (රු.) | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|
| **දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය, ලබුදූව ප්‍රධාන ලේකම් නිල නිවස, දකුණු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ නිල නිවාස පිහිටි ගොඩනැගිල්ල, මන්ත්‍රී නේවාසිකාගාරය අවට භූමිය, ආණ්ඩුකාර ලේකම් නිල නිවස අවට භූමිය ඇතුළු ලබුදූව නිල නිවාස සංකීර්ණ පරිශ්‍රය සහ හම්බන්තොට මයුරපුර නිවාඩු නිකේතනය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම. (SPC/CS/NCB/23/01)** | **2023.06.01- 2024.05.31** දක්වා | රු. **100,000.00** | රු. **1,000.00** |

03. ලංසුව සමග ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බැංකුවකින්, දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබාගත් 2023.08.31 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන මුදල් කුවිතාන්සියේ මුල් පිටපත ලංසු පත්‍රිකාව සමග ඉදිරිපත් කළ යුතුය.චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ඉදිරිපත් කරනු ලබන කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, එහි මුල් පිටපතෙහි **මුල් පිටපත** යනුවෙන් සඳහන් කළ යුතු අතර අනු පිටපතෙහි **අනු පිටපත** යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙන ම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරය ද මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

05. මුද්‍රා තබන ලද මිල ගණන් පත්‍රිකා 2023.05.03 වන දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන පිවිසුම් දොරටුව අසල තබා ඇති ලේඛනයේ සටහන් කර ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවර **ලංසු අංකය හා "පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත් විවෘත කිරීම 2023.05.03 දින ලංසු භාර ගැනීම අවසන් වූ වහාම පෙ.ව. 10.30 ට ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරු ගේ බලයලත් නියෝජිතයෙක් හට සහභාගී විය හැකිය.ප්‍රමාද වී ඉදිරිපත් කරන මිල ගණන් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව කාරුණිකව සලකන්න.

සැලකිය යුතුයි : ටෙන්ඩර් දැන්වීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.sp.gov.lk වෙබ් අඩවියෙහි දිස්වනු ඇත.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**එස්.එච්.දහනායක මාවත,**
**ගාල්ල.**


| | | | |
|---|---|---|---|
| දිනය | : 2023.04.10 | දුරකථන අංකය | : 091 – 4944016/ 091-4946368 |
| ෆැක්ස් | : 091 – 2242697 | ඊ මේල් | : procurementplan1@gmail.com |